**මහරගම නගර සභාව - 2021**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**----------------------------**

මහරගම නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශන, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහරගම නගර සභාව මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය
**----------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**---------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) නගර සභාවේ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් කර තිබූ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 2.2 | අංක 607629 දරන ජංගම ගිණුම 2015 අගෝස්තු මාසයේදී වසා තිබුණද මුදල් යටතේ රු.2,052,258 ක නාමික වටිනාකමක් සමාලෝචිත වර්ෂයේදී ද ගිණුමේ දක්වා තිබුණි | නාමික වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන

---

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු බව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති හා අංක LGD/10A/4/න.ගි/ 2019 දරන ලිපිය අනුව දන්වා ඇතත් නගර සභාව විසින් සමාලෝචිත වර්ෂයේදීද වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මෙම වර්ෂයේදී මේ සම්බන්ධව කටයුතු කරනු ලැබේ. | සියළු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.23,789,981 ක් ලැබී තිබුණද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන ප්‍රදාන දක්වා නොතිබුණි. | මෙය සටහන් අංක 10 හි ඇතුළත් නොකළද සටහන් අංක 04 හි වෙනත් පරිත්‍යාග පළාත් සභා යටතේ භෞතික සැළැසුම් තීරුවේ සටහන් කරන ලද වටිනාකම විස්තීර්ණ ආදායම ප්‍රකාශයට ආදායමක් ලෙස ගළපා ඇත. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළ රු.97,582,197 ක ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් සියයට 10 ක ප්‍රමාණය එනම් රු.9,758,220 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් යටතේ දැක්විය යුතු වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සටහන් අංක 05 නැවත සකස් කර විස්තීර්ණ ආදායම් ලේඛනයටද 2022 ගිණුම සකස් කිරීමේදී ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | -එම- |
| (ඈ) | ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් සටහන් අංක 5 යටතේ ඇති වටිනාකම ගැලපීමෙන් පසු ඉතිරි වටිනාකම හා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ රු.111,613,958 ක් ලෙස දැක්විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල එසේ දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | -එම- |
| (ඉ) | 2021 වර්ෂය තුළ සභා අරමුදලින් රු.161,753,480 ක් වැයකර ව්‍යාපෘති 204 ක වැඩ නිමකර තිබුණද එම ව්‍යාපෘතිවල වටිනාකම දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කරන බව දැනුම්දෙමි. | ඉදිකිරීම් නිම කළ සියළු ව්‍යාපෘති ප්‍රාග්ධනිත කළ යුතුවේ. |
| (ඊ) | සභා අරමුදලින් ක්‍රියාත්මක රු.22,205,682 ක් වටිනා නොනිමි ව්‍යාපෘති 10 හි වටිනාකම නොනිමි වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නොනිමි වැඩ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු හා අංක LGD/09/4/ 2019(1) දරන චක්‍රලේඛයේ උපදෙස් පරිදි සියළු වත්කම් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතු වුවත් | මෙම වරද 2022 අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | මංමාවත්, බෝක්කු හා පාළම් වටිනාකම් දක්වා දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබූ අතර ඒ සඳහා ක්ෂය විමද ගිණුම් ගතකර නොතිබුණි. | | |
| (ඌ) | දේපළ, පිරියත හා උපකරණ සඳහා වූ සටහනෙහි පුස්තකාල පොත් ඉවත් කිරීමට අදාළ ක්ෂය හා වත්කම් විකිණීමට අදාළ පිරිවැය හා ක්ෂය ඉවත්කිරීම් ගැළපීම් කර නොතිබුණි. | පුස්තකාල පොත් ඉවත් කිරීම ගළපා ඇති අතර ක්ෂය කිරීම්ද කර ඇති බව දන්වමි. | නිරීක්ෂණයේ සඳහන් තොරතුරු සටහනේ නොමැති බැවින් නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. |
| (එ) | ආදායම් ප්‍රකාශනය අනුව දේපළ, පිරියත හා උපකරණ ක්ෂය රු.64,387,924 ක් වුවද නිවැරදි ක්ෂය වටිනාකම රු.31,896,139 ක් වූයෙන් දේපළ, පිරියත හා උපකරණ ක්ෂය රු.32,491,785 ක් වැඩිපුර ගිණුම්ගත කර ඇති බැවින් කාලච්ඡේදයේ ඌණතාවය වැඩි වී තිබුණි. | 2020 වර්ෂයේදී ක්ෂය කිරීම් ගණනය නොකරන ලද වත්කම් වර්ග දෙකක ක්ෂය කිරීම් ගිණුම හරහා ගළපා සමුච්චිත අරමුදලට ගැළපීම් කිරීම. 2022 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරමි. | නිවැරදි ක්ෂය වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඒ) | ස්ථාවර තැන්පත් සඳහා ලද පොළිය ගණනය කිරීමේදී රාජ්‍ය ආයතන සඳහා රඳවාගැනීමේ බද්ධ (WHT) අඩු නොකළ යුතු වුවද ස්ථාවර තැන්පත් 03 ක් වෙනුවෙන් ලද පොළිය මත රු.121,861 ක රඳවාගැනීමේ බදු අඩුවෙන් ගිණුම්ගත කිරීමෙන් ආදායම එම වටිනාකමෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙය ජාතික ඉතිරි කිරිමේ බැංකුව විසින් කරන ලද්දකි. පෙර වර්ෂයකදීද මෙසේ ස්ථිර තැන්පත් ගිණුම් කිපයක පොළියෙන් (WHT) අඩු කර තිබුණි. කීප වතාවක්ම පොළිය මත (WHT) අඩු නොකරන ලෙස බැංකුවට ලිඛිතව දැනුම් දුන්නද ඔවුන් එයට අවධානය යොමු නොකරන බැව් පෙනී යයි. මෙවර Tax අඩු කිරීම් ද නැවත ඉල්ලා ලිඛිතව බැංකුවෙන් ඉල්ලීම් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | නිවැරදි පොළි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඔ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වර්ෂයේ අතිරික්තය හෝ ඌණතාවය ලෙස රු.678,879,509 ක් දක්වා තිබුණ ද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය අනුව ඌණතාවය රු.47,172,349 ක් වූයෙන් රු.631,707,160 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.828,378,427 ක් ද ලද ලාභාංශ රු.1,898,690 ක් හා ලද පොළී රු.6,178,215 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව වාර්තා කළ යුතුවේ. |
| (ක) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ණය පොළී ගෙවීම රු.204,348 ක් ද ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.2,379,981 ක් ද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වියදම රු.68,962,914 ක් ද දක්වා නොතිබුණි. එමෙන්ම ණය ගෙවීම රු.2,400,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි වාර්තා කළ යුතුවේ. |
| (ග) | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොළිය රු.17,618,530 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.15,417,846 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් ආදායම රු.2,200,684 ක් අඩුවෙන් ගිණුම්ගත කර ඇත. | -එම- | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ජ) | වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් ලැබිය යුතු පොළී ප්‍රමාණය රු.4,494,077 ක් වුවද රු.2,293,393 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලැබිය යුතු පොළී රු.2,200784 ක් අඩුවෙන් ගිණුම්ගත කර ඇත. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්කම් හා වගකීම් ප්‍රකාශනය අනුව සමුච්චිත අතිරික්තය හෝ ඌණතාවය රු.678,879,509 ක් වුවද හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය අනුව එය රු.679,451,690 ක් ලෙස දක්වා තිබිමෙන් රු.572,181 ක වෙනසක් නිරීක්ෂණය විය. | පෙර සිට පැවත එන වෙනසකි. පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගි ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු.37,568,135 ක් වැඩියෙන් හා රු.20,372,196 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වසර ගණනාවක සිට පැවත එන වෙනස නිවැරදි කිරීමට පියවර ගනිමි. | -එම- |
| (ඇ) | නාගරික සංවර්ධන අරමුදල් ආයෝජන ගිණුමේ ශේෂය රු.38,611,503 ක් වුවද එම තැන්පත් ගිණුමේ ශේෂය රු.45,472,612 ක් වුයෙන් රු.6,861,109 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගෙවල් කුළී මණ්ඩල කාර්ය මණ්ඩල දීමනා රු.6,000 ක් නොගෙවූ වැටුප් තැන්පත් උපලේඛණයේ සටහන් වීමෙන් මෙය සිදුවී ඇත. නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | -එම- |
| (ඈ) | උපලේඛන අනුව කසළ ඉවත් කිරීම වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙනුවෙන් රු.43,366,123 ක් ගෙවා තිබුණ ද මූල්‍ය ප්‍රකාශන අනුව වියදම රු.44,851,272 ක් වුයෙන් රු.1,485,149 ක වෙනසක් නිරීක්ෂණය විය. | පෙන්වාදී ඇති ශේෂවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට සටහන් කර ගතිමි. | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.9,866,664 ක් වටිනා ගිණුම් විෂයන් 08 කට අදාළව උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | 2022 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | විස්තරාත්මක උපලේඛණ ඉදිරිපත් කළ යුතුවේ. |

**1.6.4 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාළ ගණුදෙනුකරුවන් විසින් වරිපනම් ගෙවීම සඳහා ලබා දී තිබූ රු.75,293 ක් වටිනා චෙක්පත් 06 ක් ද දැන්වීම් පුවරු ගාස්තු වෙනුවෙන් ලබා දී තිබූ රු.212,472 ක් වටිනා චෙක්පත් 03 ක් ද කඩකුළී වෙනුවෙන් ලද රු.40,950 ක් වටිනා චෙක්පතක් ද අගරු වී තිබුණු අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනය පෙන්වා දුන් අඟරු චෙක්පත් සඳහා මුදල් අයකර ගැනීමට මේ වන විට ක්‍රියා මාර්ග ගෙන ඇත. | ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

1.7 **අනුකූල නොවීම්**

1.7.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 396(ඈ) | නිකුත්කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ චෙක්පත් 52 ක් සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි. | විගණනය පෙන්වා දුන් චෙක්පත් 52 සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මුදල් රෙගුලාසි 396 (ඈ) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් තිබුණද යාවත්කාලීන කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.47,172,349 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.331,691,844 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ වරිපනම් ආදායම රු.244,429,353 ක් වුවද ඉන් රු.55,556,313 ක් හෙවත් සියයට 23 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. තවද 2021 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු අයකළ හැකි දේපළ සංඛ්‍යාව 91132 ක් වුවද ඉන් බදුකරුවන් 72504 ක ගෙන් අයවිය යුතු හිඟ වරිපනම් ශේෂය රු.201,664,734 කි. | 2020 හා 2021 වර්ෂවල කොවිඩ් වසංගත තත්වය නිසා වරිපනම් ගෙවීම් අඩු විය. 2021 දෙසැම්බර් මස ජංගම සේවා 04 හා 2021 වර්ෂයේ ජංගම සේවා 35 ක් පවත්වා හිඟ අය කර ගැනීමට කටයුතු කර ඇත. රු.50,000ට වැඩි හිඟ ලැයිස්තු ආදායම් පරීක්ෂකවරුන්ට ලබා දී අය කිරීමට කටයුතු කර ඇත. 2022 ජනවාරි 01 දින සිට මේ දක්වා මුළු හිඟ මුදලින් රු.47,357,602 ක් අයකර ඇත. | වරිපනම් ආදායම අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | **කුළී** | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ කඩකුළී ආදායම රු.23,305,410 ක් වුවද ඉන් රු.6,506,329 ක් හෙවත් සියයට 28 ක් වර්ෂය තුළ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | 2021 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් පැන වූ නිරෝධායන ඇදිරි නීතිය නිසා රට වසා දැමීමත් ගෙවීම් අඩුවීමට හේතු විය. | හිඟ කඩකුළී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | 2021 ජනවාරි 01 දිනට හිඟ කඩකුළී ශේෂය රු.9,370,439 ක් වුවද ඉන් රු.6,304,365 ක් හෙවත් සියයට 67 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | පෙන්වා ඇති හිඟය තුළ සති පොළෙහි වෙළදාම් කළ නොහැකි නැවත සභාවට දුන් කඩ බක්කි 12 ක හිඟයක් ද වේ. කොරෝනා වසංගතය හේතුවෙන් කපාහළ යුතු කඩකුළී රු.900,000 ක් ද මෙම හිඟය තුළ වේ. සියළු හිඟ මුදල් සඳහා අවසාන නිවේදන මේවන විට නිකුත් කර ඇත. දින ඉක්ම වූ පසු | හිඟ කඩකුළී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | නඩු පැවරීමට කටයුතු කරනු ලැබේ. | |
| (iii) | කඩ කුළී බදු ගිවිසුමෙහි 03 වන වගන්තිය අනුව තුන් මසකට අධික කාලයක් බදු කුළිය ප්‍රමාද කළහොත් බදුකරුට දේපළෙහි වෙළඳ අයිතිය අහිමි කරන බව දක්වා තිබුණද මාස 03 ත් අවු 07 ත් අතර රු.10,478,176 ක හිඟ හිටි කුළියක් පවතින කඩ කාමර 153 ක් පැවති අතර එම කඩ කාමර සම්බන්ධයෙන් ඉහත වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. | හිඟ ගෙවීමට ඇති සියළුම කඩ කාමර හා සති පොළ කඩ බක්කි සඳහා අවසාන නිවේදන යවා ඇත. දින 14 ඉක්මවූ පසු නීති මගින් කටයුතු කරනු ලැබේ. | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (iv) | ගිවිසුම අනුව වර්ෂ 03 ක් හෝ වර්ෂ 05 ක් තුළ බදු ගිවිසුම් අළුත් කළ යුතු වුවද බදු ගිවිසුම් 123 කට අධික ප්‍රමාණයක් කල් ඉකුත් වී තිබුණද නව ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම බදු ගිවිසුම් අත්සන් කිරීමෙන් තොරව කඩ කාමර බදු දුන් අවස්ථාද පැවතුණි. | -එම- | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ගිවිසුම් නොමැති කඩ සඳහා නව ගිවිසුම්වලට එළඹිය යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **ආරක්ෂක සේවා සැපයීම් පරික්ෂාව**<br>2017 වසරේ සිට එකම ආයතනයකින් ආරක්ෂක සේවාව ලබා ගෙන තිබුණ අතර ටෙන්ඩර් කැඳවීමකින් තොරව වසරින් වසර ගිවිසුම් අලුත් කරමින් 2022 දක්වාම වෙස්ප්‍රෝ ආයතනය සමඟ ගිවිසුම් ගත වී තිබුණි. තවද ආරක්ෂක සේවා ගිවිසුමේ 04 වන වගන්තිය අනුව එක් ආරක්ෂක නියාමකයෙක් වෙනුවෙන් පැය 12 ක වැඩමුරයක් සඳහා රු.1,317 ක් ගෙවීමට ගිවිසුම්ගත වී තිබුණද ඊට පටහැනිව 2021 සැප්තැම්බර් | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 2/8/2/1(1) හා 2011.09.30 දිනැති ලිපිය අනුව මහරගම නගර සභාවේ 2017 වර්ෂයේ ආරක්ෂක සේවා සැපයිම සඳහා බස්නාහිර පළාත් සභාවේ ආරක්ෂක සේවා ආයතනය වන වෙස්ප්‍රෝ ආයතනය වෙත 2017.02.01 දින සිට ලබා දිමට 2016.12.21 දින අංක 3751 දරණ පරිපාලන කමිටුව තිරණය කර ඇත. ඒ අනුව අවුරුද්දක් පාසා කාලය දිර්ඝ කිරීමක් සිදු කර ඇත. | වාර්ෂිකව ගිවිසුම්ගත විය යුතු අතර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | සිට දෙසැම්බර් දක්වා රු.1,517 බැගින් ගෙවීම් කිරීම නිසා (7148 x 200) රු.1,429,600 ක් වැඩිපුර ආරක්ෂක සේවය සඳහා ගෙවීම් කර තිබුණි. | 2021.10.28 දින පවත්වන ලද මාසික මහා සභාවේදී වෙස්ප්‍රෝ ආයතනය ඉදිරිපත් කර ඇති නව මිලගණන් පිළිගෙන ඇත. ඒ අනුව 2021 සැප්තැම්බර් මස සිට නව මිල ගණන් අනුව ගෙවීම් කර ඇත. සංශෝධිත මිල ගණන් ඇතුළත් කර ගිවිසුමක් අත්සන් කර ගැනීමට අතපසු වී ඇත. නමුත් එම මිල ගණන් යටතේම 2022 වර්ෂයේ ගිවිසුම්ගත වී ඇත. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩකුළී ගිවිසුම අනුව බදුකරු මාස 06 කට අධික කාළයක් කුළී ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් කුළී ගිවිසුම ඒකපාර්ෂිකව අවලංගු කිරීමේ බලය නගර සභාව සතු වුවත් මාස 6 සිට අවුරුදු 3 දක්වා රු.7,058,936 ක කුළී ප්‍රමාද වූ කඩ කාමර 109 ක කුළී ගිවිසුම් අවලංගු කර එම කඩ කාමර නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩකුළී ගිවිසුම අවසන් වී ඇති සියළුම කඩ කාමර සඳහා 2022.06.15 දිනැතිව අවසන් නිවේදන යවා ඇත. දින 14 ක් තුළ ගිවිසුම් අළුත් නොකළහොත් ඒ සඳහා නීති මගින් කටයුතු කරනු ලැබේ. | කුළී ගිවිසුම් අනුව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | නාවින්න ක්‍රීඩාංගනය අත්පත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ප්‍රවර්තන වර්ෂයේදී රු.13,717,577 ක් ඇතුළුව එකතුව රු.24,554,972 ක් සභාව විසින් ගෙවා තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඔප්පුවක් මඟින් පවරා ගෙන නොතිබුණි. | නාවින්න ක්‍රිඩාංගනය මහරගම නගර සභාවට පවරා දෙන මෙන් 2020.07.13, 2020.08.21, 2020.12.27 හා 2021.07.07 දිනැතිව ඉල්ලීම් කර ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් සංවර්ධන හා කළමනාකරණගේ අංක 10/2/1587 හා 2020.06.10 දිනැති ලිපියෙන් තවදුරටත් රු.4,912,236 ක හිඟ මුදලක් ගෙවීමට ඇති බව දන්වා ඇත. මේ සම්බන්ධව සාකච්ජාවේදීද සභාවට පවරාදෙන ලෙස ඉල්ලා ඇත. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.3** ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් කසළ ඉවත් කරනු ලබන ව්‍යාපාරික ස්ථාන 186 ක් තිබුණද එම ව්‍යාපාරිකයින් විධිමත්ව ගිවිසුම් වලට එළඹ නොතිබීම නිසා නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. | මුලින්ම කසළ බදු අයකර ඇත්තේ 2018 වර්ෂයේ සිටයි. 2020 වර්ෂයේ මුල් කාලයේදී පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ ව්‍යාපාරික ආයතන කසළ බදු ගෙවීමට නොහැකි බව දන්වා ඇත. ඇතැම් ආයතන වසා දමා ඇත. මේ වන විට අදාළ ආයතන සමඟින් ගිවිසුම්ගත වීමට කටයුතු සම්පාදනය කරමින් පවතී. | ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සාරාංශ ආදායම් ලේඛනය අනුව කසළ ආදායම රු.4,572,857 ක් වුවද උපලේඛන අනුව කසළ ආදායම රු.6,935,700 ක් වූයෙන් ලැබිය යුතු කසළ ආදායම රු.2,362,843 ක් ගිණුම්ගත කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා දැමීම නිසා මුදල් අයකර ගැනීමට අපහසුවීමෙන් මෙම තත්ත්වය ඇති වී තිබේ. | නිවැරදි ආදායම ගිණුම්ගත කළ යුතුවේ. |

**3.4** **වත්කම් කළමනාකරණය**

-------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනයට ලබාදුන් තොරතුරු අනුව සභාව සතුව දේපළ 77 ක් පැවතිය ද ස්ථාවර වත්කම් ලේඛනය අනුව දේපළ 46 ක් වූයෙන් දේපළ 31 ක වෙනසක් නිරීක්ෂණය විය. එමෙන්ම දේපළ 38 ක වටිනාකම රු.10,969,916 ක් ලෙස තක්සේරු කර තිබුණ ද ඉතිරි දේපළ වල වටිනාකම තක්සේරු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් තක්සේරු කිරීම් ප්‍රත්‍යාගණනය කිරීම් වර්තමාන භාවිතය තහවුරු කර ගැනීම් සම්බන්ධව උපදෙස් ලබාගෙන නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | සියළු දේපළ තක්සේරු කළයුතු අතර ලේඛන විධිමත්ව යාවත්කාලීන කළ යුතුවේ. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මියගිය හා විශ්‍රාම ගිය නිළධාරීන් 15 දෙනෙකුගෙන් රු.984,012 ක්ද සේවය හැරගිය නිලධාරින් 19 දෙනෙකුගෙන් රු.886,666 ක් ද ස්ථානමාරු වී ගිය නිලධාරින් 16 දෙනෙකුගෙන් රු.1,328,567 ක් ද වශයෙන් එකතුව රු.3,199,245 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ කරමින් පවතී. | ණය මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |